සති පාසල

7 ශ්‍රේණිය | විද්‍යාව | අගෝස්තු 4වන සතිය

15 - පස

01. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්

- ඔබේ විද්‍යාව පෙළ පොතේ (2 කොටස) පිටු අංක 61 හි දැක්වෙන ක්‍රියාකාරකම 15.1 සිදු කරන්න.
- ඔබේ විද්‍යාව පෙළ පොතේ (2 කොටස) පිටු අංක 63 හි දැක්වෙන ක්‍රියාකාරකම 15.2 කෙරෙහි අවධානය යොමු කරන්න.
- ඔබේ විද්‍යාව පෙළ පොතේ (2 කොටස) 61,62 පිටු අංක යටතේ ඇති **විවිධ පස් වර්ග** නම් පාඩම හොඳින් අධ්‍යයනය කරමින් මැටි පස, වැලි පස හා ලෝම පස පිළිබඳව අධ්‍යයනය කරන්න.
- ඔබේ විද්‍යාව පෙළ පොතේ (2 කොටස) පිටු අංක 63 හි දැක්වෙන ක්‍රියාකාරකම 15.3 සිදු කරන්න.
- ඔබේ විද්‍යාව පෙළ පොතේ (2 කොටස) 63,64 පිටු අංක යටතේ ඇති **පසේ සංයුතිය** නම් පාඩම හොඳින් අධ්‍යයනය කරමින් පාංශු ඛනිජ, පාංශු ඛනිජවල කාර්ය, පාංශු කාබනික ද්‍රව්‍ය, පාංශු කාබනික ද්‍රව්‍යවල කාර්ය පිළිබඳව අධ්‍යයනය කරන්න.
- ඔබ උගත් කරුණු ඇසුරෙන් කෙටි සටහනක් සකස් කරන්න.

02. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කර ගත හැකි ආධාරක

- 7 ශ්‍රේණිය විද්‍යාව දෙවන පෙළ පොත (පිටු අංක 61 සිට 64)
- E - නැණ පියස වෙබ් අඩවිය
  https://www.enenapiyasa.lk/lms/course/view.php?id=21#section-15
- E - තක්සලාව වෙබ් අඩවිය
  https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=986&section=15
- ගුරු ගෙදර නාලිකාව
  https://www.youtube.com/watch?v=Wwo2e52D_8o&t=26s

03. මෙම සතිය තුළ නියමිත පාඩම්වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල

- පසේ විවිධ ආකාර නම් කිරීම.
- පසේ විවිධ ආකාර සංසන්දනය කිරීම.
- පසේ සංයුතිය දැක්වීම.
- පසේ සංඝටක සහ ඒවායේ ක්‍රියාකාරිත්වය විස්තර කිරීම.

04. ඇගයීම

01) වැලි අංශු වැඩිපුර ඇති පස් වර්ගය නම්,
1) මැටි පස 2) ලෝම පස 3) වැලි පස 4) පාෂාණ

02) පසෙහි අඩංගු ඝන සංඝටකවලට අයත් වන්නේ,
1) පාංශු ජලය හා පාංශු වාතය 2) පාංශු ජලය හා පාංශු ඛණිජ
3) පාංශු ඛණිජ හා පාංශු ජීවීන් 4) පාංශු ඛණිජ හා පාංශු කාබනික ද්‍රව්‍ය

03) වාතය අඩුවෙන්ම රඳා පවතින පස වන්නේ,
1) වැලි පසය 2) මැටි පසය 3) ලෝම පසය 4) හියුමස් ය

04) හියුමස් සෑදී ඇත්තේ,
1) දිරාගිය සත්ත්ව කොටස් වලිනි. 2) දිරාගිය ශාක හා සත්ත්ව කොටස් වලිනි.
3) මැටි පස් හා ජෛන්ද්‍රිය ද්‍රව්‍ය වලිනි. 4) වැලි වලිනි

05) පසේ ජීවත් නොවන ජීවියෙකි.
1) පත්තෑයා 2) වේයා 3) හැකරැල්ලා 4) ඇහැටුල්ලා

06) ගොඩනැගිලි සෑදීමට සුදුසු පස් වර්ගය වන්නේ,
1) මැටි පස 2) වැලි පස 3) ලෝම පස 4) රොන්මඩ